**2561 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2016 (2017)**

**(04) බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය**

**S 4**

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## II කොටස

**2.** (i) බුදුදහමේ චිරස්ථිය සඳහා අශෝක රජතුමාගෙන් සැලසුණු සේවය විස්තර කරන්න. (ලකුණු 06 යි)

(ii) කාලිංග සංග්‍රාමයෙන් ලැබූ විජයග්‍රහණය අශෝක රජතුමා බුදුදහම වෙත ඇදීයාමට තුඩුදුන් ප්‍රධාන හේතුව ලෙස සැලකීමේ යෝග්‍යතාව විමර්ශනය කරන්න. (ලකුණු 06 යි)

(iii) චක්‍රවර්ති සංකල්පය අනුව රාජ්‍ය පාලනය කළ ප්‍රථමයා ධර්මාශෝක රජු බව තහවුරු කෙරෙන සාධක ඉදිරිපත් කරන්න. (ලකුණු 06 යි)

**3.** (i) මහායාන බුදුසමයේ ආරම්භය හඳුන්වා දෙමින් හීනයාන හා මහායාන සම්ප්‍රදායයන්හි පවත්නා වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(ii) මහායාන සම්ප්‍රදායයෙහි දැක්වෙන ප්‍රධාන මත හතර නම් කොට එයින් එකක් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) මහායාන බුදුදහමේ ඇතුළත් 'දශභූමි' නම් වශයෙන් දක්වා එයින් පහක් විස්තර කරන්න. (ලකුණු 06 යි)

**4.** (i) භාරතයේ වලභි විශ්වවිද්‍යාලයේ ආරම්භය හා සංවර්ධනය පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)

(ii) මේ විශ්වවිද්‍යාලයේ ඉගැන් වූ අධ්‍යාපන විෂයමාලාව හඳුන්වා දෙන්න. (ලකුණු 06 යි)

(iii) හියුංසියැං, ඉත්සිං වැනි සංචාරකයන් මේ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන දියුණුව ගැන පළකරන අදහස් සමාලෝචනය කරන්න. (ලකුණු 06 යි)

**5.** (i) ථෙරවාද බුද්ධ ධර්මයේ චිරස්ථිතිය උදෙසා ක්‍රියා කළ භාරතීය පඬිවරුන් දෙදෙනෙකු ගැන හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)

(ii) සූත්‍ර පිටකයට අයත් නිකාය ග්‍රන්ථවලට ලියූ අටුවා පිළිබඳව කෙටි විස්තරයක් සපයන්න. (ලකුණු 06 යි)

(iii) ඛුද්දකනිකාය හඳුන්වා ඊට අයත් ඛුද්දකපාඨ, ධම්මපද හා සුත්තනිපාත යන ග්‍රන්ථ උදෙසා රචිත අටුවා ගැන කෙටි විවරණ සපයන්න. (ලකුණු 06 යි)

**6.** (i) මියන්මාරයට (බුරුමයට) බුදුසමය හඳුන්වා දීම පිළිබඳ පවත්නා කතා පුවත් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(ii) පළමුවන විජයබාහු රාජ්‍ය සමයේ දී ශ්‍රී ලංකාව හා මියන්මාරය (බුරුමය) අතර පැවති බෞද්ධාගමික සම්බන්ධතා පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) මියන්මාරයේ (බුරුමයේ) කල්‍යාණි ශිලා ලිපියෙන් හෙළිවන ඓතිහාසික වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 06 යි)

**7.** (i) ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වා දීමත් සමග එවකට පැවති දේශීය ඇදහිලි හා විශ්වාස බුදුදහමට අනුවර්තනය වූ ආකාරය කෙටියෙන් දක්වන්න. (ලකුණු 06 යි)

(ii) පණ්ඩුකාභය රාජ්‍ය සමයේ දී ශ්‍රී ලංකාවේ ජෛනාගම පැවති බවට දැක්විය හැකි සාධක කවරේදැයි විමර්ශනය කරන්න. (ලකුණු 06 යි)

(ii) ජෛන ආගමට අමතරව මේ වකවානුවේ ශ්‍රී ලංකාවේ පැවති වෙනත් ආගමික ඇදහිලි විශ්වාස කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

**8.** (i) බුද්ධ ප්‍රතිමා වන්දනාවේ ආගමික වැදගත්කම හඳුන්වා බුදුපිළිම නිර්මාණයේ ආරම්භය පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06 යි)

(ii) විවිධ ඉරියව් අනුව බුදුපිළිම වර්ග කොට ඇති ආකාරය හඳුන්වා එම පිළිම පිහිටා ඇති ශ්‍රී ලංකාවේ ඓතිහාසික ආගමික ස්ථාන නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) බුදුපිළිම තැනීමේ දී උපයෝගි කොට ගෙන ඇති ආසන වර්ග කවරේදැයි නිදසුන් මගින් විමර්ශනය කරන්න. (ලකුණු 06 යි)

* * *